දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின்-அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය
எனது இல.
My No.
PSC/APL/9/23/2023

ඔබේ අංකය
உமது இல.
Your No.
ED/01/27/14/4-6

දිනය
திகதி
Date
2024.09. 11

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

2022/2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම
ශ්‍රී ලංකා ගුරු සේවය

ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ 2022/2023 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02) ඒ අනුව **වහාම** එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. එසේම මීළඟ වර්ෂයේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු පටිපාටිය මගින් නියම කර ඇති කාල සටහනට අනුගතව සියලු කටයුතු කිරීමට තරයේ සැලකිලිමත් වන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව කාරුණිකව දන්වමි.

03) එසේම මේ වන විට සියළුම රාජ්‍ය ආයතනවල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල දක්වා ඇති ස්ථානමාරු කාල සටහන් සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති අතර ඔබ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අදාළ වාර්ෂික ස්ථානමාරු පටිපාටීන්හි ස්ථානමාරු කාලසටහන්ද යටෝක්ත තීරණයට අනුගත වන පරිදි සංශෝධනය කර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙසද එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

05) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමක් සිදු නොකෙරෙන අතර, අදාල තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

06) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් නොසිට ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

07) රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ ලබා සිටින සියලුම නිලධාරීන් වහාම නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

08) වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

09) එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා -2022/2023 සම්බන්ධ
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ

අනු අංකය	මූලකුරු සමග නම	වර්තමාන සේවා ස්ථානය	ස්ථාන මාරු ලද පාසල/ සේවා ස්ථානය	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය
1	එච්.ඒ. සුනීතා මිය	හ/තංගල්ල බාලිකා විද්‍යාලය	හ/වලස්මුල්ල ජාතික පාසල	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
2	ටී.පී.එම්. ඩෙලිකා මිය	ගා/රිච්මන්ඩ් විද්‍යාලය	ගාල්ල වඳුරඹ ජාතික පාසල	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
3	ඊ.ජී.එස්. අනුත්තරා මිය	නු/ ගාමිණී ජාතික පාසල	බ/ ඇටම්පිටිය ජාතික පාසල	අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරු නියෝගය අවලංගු කර පුරප්පාඩු තිබෙනම් වැලිමඩ ජාතික පාසල වෙත ස්ථාන මාරු කිරීම හෝ 2024 වාර්ෂික ස්ථාන මාරු යටතේ අනිවාර්ය ස්ථාන මාරු ලබා දීම
4	ඩී.ඒ.ආර්. ප්‍රියදර්ශනී	මහ/ගම්/විමලධර්ම ජාතික පාසල	මහ/අනුරුද්ධකුමාර ජාතික පාසල	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
5	ජී.එම්. තනූජා මනෝහාරි ද සිල්වා	ගා/ ශ්‍රී දේවානන්ද ජාතික පාසල	ගා/ඇල්පිටිය ආනන්ද ජාතික පාසල	ඉල්ලීම ඉටු වී ඇත
6	ආර්.ජී.ඩී.එස්. අබේරත්න	නු/ ගාමිණී ජාතික පාසල	පාසලක් නිර්දේශ වී නැත	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
7	එම්.සී. ප්‍රියන්ති මිය	ගා/ මහින්ද විද්‍යාලය	ගා/ බටේමුල්ල ජාතික පාසල	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
8	බී.එල්.ඩී.එස්. නිල්මිණී බුත්පිටිය මිය	බ/බදුල්ල මධ්‍ය මහා විද්‍යාලය	බ/නාවුල්ල ජාතික පාසල	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
9	ඕ.එම්. චතුරංගි ඉරේෂිකා මිය	ගා/ ධර්මාශෝක විද්‍යාලය	ගා/ රේවත විද්‍යාලය	ඉල්ලීම ඉටු වී ඇත
10	ඩී.එච්. කමල් ගුණරත්න මහතා	බප/කැල/ගුරුකුල විද්‍යාලය	කෑ/ ගෝතමී විද්‍යාලය	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
11	ජී.එච්. මල්ලිකා මිය	මාර/රාහුල ජාතික පාසල	මාර/ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය	විශ්‍රාම ගොස් ඇති බැවින් අභියාචනය සලකා නොබලන ලදී
12	ජී.ඊ. ප්‍රියන්ත මහතා	ශ/ගැටමාන්න විජය ජාතික පාසල	බප/කළු/ශාන්ත ජෝන් විද්‍යාලය	ඉල්ලීම ඉටු වී ඇත
13	ඒ.ඩී.එල්.පී. ඔවිටියාවත්ත මිය	මහ/ උසස් බාලිකා විද්‍යාලය	මහ/ ගම්පොළ සහිරා විද්‍යාලය	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම